# ලෝක බැංකුව

## දකුණු ආසියා කලාපය

විමසීම්: කොළඹ: චූලි ද සිල්වා
ඊ-මේල් cdesilva@worldbank.org
දුරකථන: :94-11-5561-323
වොෂින්ටන්හි: සීටා ලිච්ටන්බර්ග්
දුරකථන: (1-202)483-8503
ඊ-මේල්: zlichtenberg@worldbank.org

### <u>මහජන සෞඛ්‍ය අංශය සවිමත් කරන්නට ලෝක බැංකුවේ ආධාරය</u>

**කොළඹ - ජූනි 15, 2004:**

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමාවලියෙහි කාර්යක්ෂමබවත් ගුණාත්මකබවත් දියුණු කරනු පිණිස, ශ්‍රී ලංකාවේ රජය ක්‍රියාත්මක වෙයි. ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් කෝටි හයක (රුපියල් කෝටි හයසීයක) ආධාර දීමනාවක්, අද ලෝක බැංකුව විසින් අනුමත කරන ලදී. දිස්ත්‍රික්ක, පළාත් සහ මධ්‍යම ආණ්ඩු මට්ටමෙන් රජය මේ ක්‍රියාවලිය සවිමත් කරන්නට ක්‍රියාකාරිවනවිට, මුල්තැන ලබන්නේ, ජනතාවට - වෙසෙසින්ම රටේ ඉතාම දිළිඳු ජනතාවට - සෞඛ්‍ය සේවා ලබා ගැනීමේ අවස්ථා දියුණු කිරීමේ කාර්යයයි.

**සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය** (HSDP) විසින් විශේෂ අවධානයට ලක් කෙරෙන්නේ, දැනට පවත්නා රෝග නිවාරණ සේවාවනට ආධාර සැපයීමේත්, ඒවා සවිමත් කිරීමේත් ක්‍රියාවලියයි. මෙම ව්‍යාපෘතියේ අරමුණු, රාජ්‍ය ආධාරක ක්‍රමෝපායය (CAS) යටතේ, ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාවට ආධාර සැපයීමේ ක්‍රමය හා සමඟ සහමුලින්ම සැසඳෙයි. එම ආධාර සැපයීමේ ක්‍රමය විසින්, ශ්‍රී ලංකාවේ සියලු දෙනාටම මහජන සේවාවල් එක සමාන ආකාරයෙන් ලැබෙන තැනට සහාය සපයනු ලැබේ. (මේ ව්‍යාපෘතිය ගොඩනැඟෙන්නේ පසුගිය සමයේ දී සාර්ථක වූ වැඩසටහන් පදනම් කොටගෙනයි). රටේ වරප්‍රසාද විරහිත පෙදෙස්වල එවැනි වැඩසටහන් සවිමත් කෙරෙන්නේය. වෙසෙසින්ම ඒවා යොමුවන්නේ, දිළිඳුකමින් පීඩිතව වෙසෙන අය බහුල ප්‍රදේශවලටයි.

**ලෝක බැංකුවේ ශ්‍රී ලංකාවේ සිටින අධ්‍යක්ෂ පීටර් හැරල්ඩ්** මෙසේ පවසන්නේය. *“ශ්‍රී ලංකාව, අපූරු ලෙස යහපත් සෞඛ්‍ය ප්‍රතිඵල දිනාගෙන සිටියි. සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි උසස් ජයග්‍රහණ ලබන රාජ්‍යයක් වශයෙන් තවදුරටත් පැවතී සිටීම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් ක්‍රියාත්මක කරනු පිණිස රජය විසින් දරනු ලබන ප්‍රයත්නයට ආධාර සම්පාදනය කිරීමට ලෝක බැංකුව කැමතියි.”* ඔහු මෙසේත් කියන්නේය. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතුරින්, හැමදෙනාටම සෞඛ්‍ය පහසුව සහ අධ්‍යාපන පහසුව පළමුවෙන් ලබාදුන් දකුණු ආසියානු රාජ්‍යවලින් එකක් වශයෙන් ශ්‍රී ලංකාවට දකුණු ආසියාවේ සුවිශේෂී තැනක් හිමිවේ. ඒ අතර, ආර්ථික වශයෙන් අවදානමට ලක්වූ දිළිඳු අය උදෙසාත්, ගැටුම් නිසා ආපදාවට පත්වූ අය උදෙසාත්, එමෙන්ම, වතුකරයේ කම්කරුවන් උදෙසාත්, මේ සේවාවල් සවිමත් කිරීම අවශ්‍යව තිබුණේය.

මේ දීමනාවෙහි ප්‍රථම කොටසවන ඇමෙරිකානු ඩොලර් කෝටි හතර (රුපියල් කෝටි 400), මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහන් සවිමත් කරනු පිණිස පළාත් සභාවලට සහ දිස්ත්‍රික්ක සෞඛ්‍ය අධිකාරීන්ටත් දෙනු ලැබේ. මෙහිදී මුල්තැන දෙනු ලබන්නේ, රෝග නිවාරක සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහන්වලටත් දිළිඳු ජන කණ්ඩායම්වල සහ නිසි පමණ සේවා නොලබන පෙදෙස්වල සෞඛ්‍ය සේවා සම්පාදන කටයුතුවලටත්ය.

මේ ව්‍යාපෘතියේ මධ්‍යකාලීන අරමුණ වන්නේ දිස්ත්‍රික්ක අතරත්, දිස්ත්‍රික්කය තුළත් සිදුවන විසමතා අඩු කිරීමයි. ඒ සඳහා කරනු ලබන්නේ අවදානමට පාත්‍රවන කණ්ඩායම්වල සිදුවන අධික මාතෘ මරණ සංඛ්‍යාව සහ ළදරු මරණ සංඛ්‍යාව අඩු කිරීමට පියවර ගැනීමයි.

මේ දීමනාවෙහි දෙවන කොටස වන ඇමෙරිකානු ඩොලර් එක්කෝටි හතළිස් ලක්ෂය (රුපියල් කෝටි 140) මඟින් මධ්‍යම ආණ්ඩුවේ වැඩසටහන් වලටත්, රටේ ආරෝග්‍යශාලාවලටත්, ආධාර සම්පාදනය කෙරේ. මේ ආධාර යොමු කෙරෙන්නේ හෘදයාබාධ සහ දියවැඩියාව වැනි බෝ නොවන රෝග හා ආශ්‍රිතව පැන නඟින ආවශ්‍යකතා සම්පාදනය කිරීමටත්, ආරෝග්‍යශාලා රටාවෙහි ව්‍යූහමය අඩුපාඩු නිරාකරණය කිරීමටත්ය.

මේ දීමනාවේ තෙවන කොටස වන ඇමෙරිකානු ඩොලර් අසූනව ලක්ෂය (රුපියල් කෝටි අසූනවය) විසින් කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යංශයේ පරිපාලන ශක්තිය දියුණු කිරීමත් මහජන සෞඛ්‍ය සේවා ක්‍රමයෙහි විශ්වසනීයත්වය, පාරදෘශ්‍ය භාවය සහ වගකීමේ ශක්තිය වර්ධනය කිරීමත්ය.

මේ ව්‍යාපෘතියේදී කාර්යසාධක නායකයා වශයෙන් ක්‍රියාකරන, **ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥවරයෙකු වන මිඛේලි ග්‍රැග්නොලාටි මෙසේ පවසන්නේය.**

*"මේ ව්‍යාපෘතිය ගොඩ නැඟී තිබෙන්නේ, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහිදී ලබන ලද සාර්ථක අත්දැකීම් සම්භාරයක් පදනම් කොටගෙනයි. ඉතාම අඩු වරප්‍රසාද සහ පහසුකම් සහිත කණ්ඩායම් දෙසට යොමුවන්නටත්, සිය සෞඛ්‍ය ක්ෂේත්‍රය නවීකරණය කරන්නටත් ශ්‍රී ලංකාව විසින් දරනු ලබන ප්‍රයත්නයට අපි සහාය සපයන්නෙමු."*

ඇමෙරිකානු ඩොලර් මිලියන හැටක (රුපියල් කෝටි හයසීයක) ආධාරය සපයා තිබෙන්නේ, ලෝක බැංකුවේ සහන සම්පාදක ශාඛාව වන ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය විසිනි.

ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාවේ යොදනු ලබන වැඩ පිළිවෙල පිළිබඳ තවත් තොරතුරු පහත දැක්වෙන ජාල අඩවියට යොමුවීමෙන් ලබාගත හැකිය.
http://www.worldbank.org/lk

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව තවත් තොරතුරු දැනගන්නා පිණිස පහත දැක්වෙන ජාල අඩවිවලට යොමුවන්න.

http://www.worldbank.lk/external/default/main?pagePK=64027221&piPK=64027220&theSitePK=233047&menulPK=28706&Projectid=P050740